රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 3000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**GEO 32643** – ජෛව භූගෝල විද්‍යාව

ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01.

i. 'ජීවය' යනු කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ජීව ලෝකයේ ප්‍රධාන රාජධානි මොනවාද? නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. 'ජෛව විශේෂයක්' සතු සුවිශේෂී ලක්ෂණ නිදර්ශන ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

02. පාරිසරික 'සහජීවනය', 'පරපෝෂිතාව' හා 'අනුවර්තනය' යන සංකල්ප ශ්‍රී ලංකාවේ නිවර්තන වැසි වනාන්තර පරිසර පද්ධති ඇසුරෙන් නිදර්ශන සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

03. "ස්වභාවික වනාන්තර පරිසර පද්ධතියක් හායනයට පත්වූ විට, ඒ මත නැවත ගොඩ නැගෙන ජෛව සංහතිය තුළ ආක්‍රමණශීලී ජීවීන්ගේ අධිකාරිත්වයක් දැකගත හැකිය." මේ ප්‍රකාශය සුදුසු නිදර්ශන සහිතව විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

04. ශ්‍රී ලංකාව දූපතක් වීම නිසා ජෛව විවිධත්වය කෙරෙහි ඇති කරන බලපෑම 'දූපත් ජෛව භූගෝල විද්‍යා' න්‍යාය ඇසුරින් විමර්ෂණය කරන්න.

(ලකුණු 15)

05. පරිසර පද්ධතියක් තුළ ආසියානු අලියාගේ (Elephas maximus) පරිසර විද්‍යාත්මක භූමිකාව ඔබ හදාරා ඇති න්‍යායන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

185

06. "කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති (Mini Hydro Power Plants) ශ්‍රී ලංකාවේ සංවේදී පරිසර පද්ධති වනසයි." කුඩා ජලවිදුලි බලාගාර ව්‍යාපෘති වලට එරෙහිව නැගෙන මෙම චෝදනාව විද්‍යාත්මක පදනමකින් යුක්ත වන්නේ කෙසේ දැයි නිශ්චිත නිදසුන් දක්වමින් විවේචනාත්මකව විග්‍රහය කරන්න.

(ලකුණු 15)

07.

i. ජෛව විවිධත්ව කොල්ලය (Bio-Piracy) යනු කුමක්ද?

(ලකුණු 03)

ii. ශ්‍රී ලංකාව ජෛව කොල්ලකරුවන්ගේ තර්ජනයට ලක්ව ඇත්තේ කෙසේ දැයි නිශ්චිත නිදසුන් සහිතව දක්වා, එම තර්ජන අවම කරගත හැකි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

@@@@@@@@@